# සීතාවකපුර ප්‍රාග් ඓතිහාසික යුගය, රාවනා සහ අවිස්සාවේල්ල

අප සංචාරයේ අරමුණ: ප්‍රාග් ඓතිහාසික යුගය, රාවනා රජු සිටි සමය හා සීතාවක රාජධානි සමයට අයත්යැයි සැලකෙන ස්ථාන සහ පුරාවස්තු අධ්‍යයනය

දිනය :2014 දෙසැම්බර් 27 වන දින

සහභාගීවුවන් ගණන: 3 (නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, අකලංක රණතුංග)

ගමන් කල ආකාරය: කොළඹ - අවිස්සාවේල්ල බසයෙන්

ජයාරූප අනුග්‍රහය: නිශාන් කුළසිංහ

මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ සිට ගමන් මාර්ගය**

කොළඹ සිට හයිලෙවල් මාර්ගයෙන් හෝ ලෝ-ලෙවල් මාර්ගයෙන්ද, කැලණිවැලි මාර්ගයේ අවිස්සාවේල්ල දුම්රියෙන්ද සීතාවක පුරට ළඟා විය හැක.



සීතාවක වැදගත් ස්ථාන සමහරක්

**ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ඉතිහාසය**

වර්තමාන අවිස්සාවේල්ල සහ ඊට යාබද ප්‍රදේශවලින් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස පිළිබඳව සාධක මතු වී ඇත. එසේ සාධක මතු වී ඇති ස්ථාන අතර මානියම්ගම බෙලිලෙන, කිතුල්ගල බෙලිලෙන, අකරවිට අස්මඩල ලෙන, කුරුවිට ප්‍රදේශයේ පිහිටි බටතොටලෙන, බටදොඹ ලෙන, ලෙනවර ලෙන්, වක් ඔය පල්හොරු කන්ද හා සාලාව වවුල් කැලේ ලෙන්, ආදිය ප්‍රධාන වේ. වරින්වර සිදු කෙරුණු කැනීම් වලදී මානියම්ගම බෙලිලෙන් වසර 7,900 කට වඩා පැරණි බවට කාබන් කාල නිර්ණය කරන ලදී. කිතුල්ගල බෙලිලෙන තුල ඇති පාංශුස්තර වසර 2,700 කට වඩා පැරණි බවටද නිර්ණය කර ඇත. මුහුදුබඩ ප්‍රදේශ වලින් හමු වන බෙලිකටු, කුරහන් පැළැටි කොටස් මෙම ලෙනෙන් හමු වී ඇත. කොස්ගම ප්‍රදේශයේ අකරවිට අස්මඩල ලෙන කැනීම් වලින් විවිධ ජ්‍යාමිතික

www.LakViskam.org

හැඩ අනුව සාදන ලද මෙවලම්, කැකුණ ඇට ආදිය හමු වී ඇත. සීතාවක රාජධානි ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිහිටුවීමේදී කැළණි ගඟ, සීතාවක ගඟ හා ගැටහැති ඔය වැදගත් අංග වූ බවට සැක නැත. මාළු අල්ලා ගැනීමට හා ජල අවශ්‍යතා සපුරා ගැනීමට එය මහගු පිටුවහලක් වන්නට ඇත. එකල මානවයා භාවිත කල හල්, වල් දෙල්, දික් කැකුණ, මාදං, කැකුණ, වැනි ශාඛ මෙම රාජධානිය ආශ්‍රිතව වර්තමානයේද දැකිය හැක. ඉහත සඳහන්කල ලෙන් ආශ්‍රිතව සිදු කල කැනීම් වලින් එකල මානවයාගේ ජීවන රටාව අවබෝධ කරගත හැකි සාධක රාශියක් හමු වී ඇත.

පසු කාලීනව අනුරාධපුර යුගයේදී දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා වළගම්බා රජතුමා පලා අවුත් මානියම්ගම ලෙන, හකුරුගල සල්ගල ලෙන, දැදිගම ලෙනගල, ආශ්‍රිතව හිඳිමින් සේනාවන් සංවිධානය කර ගෙන ගොස් සතුරන් හට පහර දී පරාජය කරන ලදී. පසුව ඔහු තමාට ආරක්ෂාව දුන් මෙම ප්‍රදේශයේ ඇති ලෙන් ආදියෙහි විහාර කරවා දී ඇත. තිඹිරිපොල රජ ලෙන, කොරතොට ලෙන, සොනගිරි ලෙන ආදී ලෙන් වල බ්‍රාහ්මීය අක්ෂර කටාරම් සෙල්ලිපි අනුව ඒවා ක්‍රි.පු. 2 වන සියවස්වල පමණ කරවූ ඒවා බවට දැනට නිගමනය කර ඇත. මෙම සෙල්ලිපි අනුව මෙම ප්‍රදේශ ආශ්‍රිතව ජනාවාස ඉදිවී බුදු දහම ව්‍යාප්ත වී තිබූ බවට තහවුරු වී ඇත.

**රාවනා රජු සිටි වකවානුව**

අවිස්සාවේල්ල ආශ්‍රිත ස්ථාන නාම කිහිපයක් සීතා යන නාමය සමග බැඳී පවතී. එම නාමයන් ලැබීමට හේතුව රාවනා රජුගේ කාලයේදී සීතා දේවිය මෙම ප්‍රදේශය අවට රදවාගෙන සිටීම නිසා ඇති වූ ස්ථාන නාම ලෙස ප්‍රබල මතයක් ඇත. එම ස්ථාන නාම අතර සීතාවක, සීතා ගඟ, සීතාවක ගම, සීතා ලෙන, සීතා පීල්ල, රාම්පාත ගල, යන ස්ථාන ප්‍රධාන වේ. මේවායේ ඉතිහාසය ගැන කියවෙන නිශ්චිත පුරාවිද්‍යාත්මක සාක්ෂි මෙතෙක් හමු වී නැත. ජන වහරේ එන විවිධ කතා හා විවිධ ලේඛන වල සඳහන් කරුණු ඔස්සේ ගවේෂණ කටයුතු කලයුතුව ඇත. ඇතැම් විද්වතුන් පවසන පරිදි මෙම නාමයන් ප්‍රදේශයේ දමිල, හින්දු ආගම අදහන ජනයාගේ ආගමනයෙන් පසු නිර්මාණය වූවේ යැයි පැවසෙන අදහසද බැහැර කල නොහැක.

රාවනා රජු සීතා දේවිය රැගෙනවිත් ලංකාපුර විවිධ ගුහා, ලෙන් ආදී ස්ථාන වල රදවා තැබූ බවට කියවේ. වර්තමාන අවිස්සාවේල්ල නගර  මධ්‍යයේ රත්නපුර මාර්ගය ආසන්නයේ පිහිටා ඇති උස් බිම් තීරුවේ පිහිටි සීතා ලෙන හා සීතා පීල්ල එසේ සීතා දේවිය රදවා තැබූ ස්ථානයක් බවට ජනශ්‍රැතියේ කියවේ. අවිස්සාවේල්ලේ සීතා ලෙන නොහොත් සීතා ගුහාව තුල සීතා දේවිය කල් ගත කල බවත් ඇය ඊට යාබදව ඇති ජල පහරේ එකල තිබූ පීල්ලකින් ස්නානය කල බවත් ඒ නිසා සීතා පීල්ල නම ලැබුණු බවටත් ජනවහරේ එයි. කටාරම් කෙටූ මෙම ලෙනෙන්ද ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධක තිබිය හැකි වුවත් ඒ සම්බන්ධයෙන් කැනීම් කල බවට දැන ගන්නට නොමැත. අඩුම වශයෙන් එම ස්ථානයට පිවිසීමට කිසිදු මාර්ගයක්වත් නොමැත.

සීතා පීල්ලට අමතරව සීතා දේවියව ස්නානය පිණිස සීතාවක ගඟෙහි වක් වූ ස්ථානයට ගෙනගිය බවත් ගඟෙහි වක් වූ ස්ථානයෙන් දිය නෑ නිසා සීතා"වක" යන නම සෑදුනු බවත් සීතාවක ගඟ හා සීතාවක පුර ආදී නම් ඒ ආශ්‍රයෙන් ඇති වූ බවට ජනශ්‍රැතියේ එයි. රාමායනයේ එන සිදුවීමක්ද සීතාවක හා සම්බන්ධව පවතී. රාම රාවනා යුද්ධය අතරතුර හනුමා විසින් සීතා දේවිය සොයා සීතාවක ප්‍රදේශයේ සැරිසරයි. මෙය දැනගත් රාවනාගේ වැඩිමහල් පුත් මේඝනාද (උපෙන්ද්‍රමිණික) නොහොත් ඉන්ද්‍රජිත් විසින් හිස කදින් වෙන්වුනු සීතා දේවියගේ රුවක් මවාගෙන හනුමාට පෙනෙන්නට සිටී. ඉන්ද්‍රජිත් මෙයින් බලාපොරොත්තු වන්නේ හනුමාගේ සහ රාමගේ බලාපොරොත්තු සුන්කර නොමගයවා රාමගේ හමුදාව නතර කිරීමයි. මෙම සිදුවීම සිදුවූ ප්‍රදේශය ලෙස ඉන්දියානුවන් සලකන්නේ මෙම සීතාවක ප්‍රදේශයයි (තායිලන්ත ග්‍රෑන්ඩ් ප්ලේස් හි වට් ප්‍රා කෙයෝ විහාරස්ථානයේ මෙම සිදු වීම සිතුවම් කර ඇති අතර තායිලන්ත රාමායනයේ එය විස්තර කර ඇත්තේ තරමක් වෙනස් ආකාරයකටය. එමෙන්ම එම සිරුරේ හිස කදින් වෙන් වී නොමැත).

සීතාවක නම සෑදුනු ආකාරය ගැන මෙවන් අදහසක්ද පවතී. සීතාවක ගඟේ වංගු නොහොත් වක ගැසුණු පෙදෙසේ ඇති "කණාමැදිරියන් වල" නම් ගැඹුරු ස්ථානයේ ජලය ඉතා සීතල නිසා "සීත වක" වී සීතාවක නාමය සෑදුනු බවයි. සීතාවක ගඟ ගැන තවත් කතාවක් ප්‍රදේශයේ වැඩිහිටියන් විසින් අප සමග පැවසූහ. එනම් තද වැසි නොමැති කාලයේදී ගඟ ශාන්තව ගලා බසිද්දී සීතා දේවිය සිය ස්වාමි පුරුෂයා වූ රාමා සිහි කරමින් ශාන්තව කල් ගෙවන ආකාරයත් වැසි වැඩි වී ගඟ රෞද්‍රව ගලා බසිනවිට රාවනා සමග කෝපයෙන් කල් ගෙවන ආකාරයත් පිළිඹිඹු කරන බවය.

www.LakViskam.org



සීතා ලෙන



සීතා පීල්ල තිබුනා යයි සැලකෙන ස්ථානය

අවිස්සාවේල්ල සිට දෙහිඕවිට දෙසට දිවෙන මාර්ගයේ තිඹිරිපොල, එල්ලෙන පාලම ආසන්නයේ සීතාවක ගං ඉවුරේ කළුගල් තලාවක පිහිටුවා ඇති "රන්පත ගල" නොහොත් ශ්‍රී පතුල් ගල නම් කැටයම් සහිත විශාල දක්ෂිණ පාද සටහනක් සහිත කළු ගල් පුවරුව රාමාගේ පාද සලකුණ සේ සලකයි. එය "රාම්පාත ගල" ලෙස ඉන්දියානුවන් විසින් හඳුන්වයි. එසේ වුවත් මේ පාද ලාංජනය සම්බන්ධව පසුකාලීන සිදුවීමක පුරාවෘත්තයක්ද ඇත. සීතාවක රාජසිංහ රජුගේ අග බිසව ගැබ් ගෙන සිටින අවධියේදී සමනොළ කන්ද තරණය කර එහි ඇති ශ්‍රී පතුල දැක වැඳ පුදා ගැනීමට දොළ දුකක් ඇතිවින. යුද්ධ සහ රටේ ගැටළු වලින් කාර්ය බහුලව සිටි රජුට මෙම ඉල්ලීම ඉටු කිරීමට හැකියාවක් නොතිබිණි. රාත්‍රී කාලයේදී බිසව දෝලාවක නංවාගෙන සීතාවක රාජධානියේ විවිධ මාර්ග වලින් දිගු දුරක් ගෙනගොස් අවසානයේ මෙම ශෛලමය පා සටහන පෙන්වීය. තමන් ශ්‍රී පාදය දුටු බවට සිතා බිසව අපමණ සතුටට පත් විය. මේ සිදු වීම නිසා මෙය ශ්‍රී පතුල නොහොත් රන්පත ගල ලෙසද හඳුන්වයි.




සිරිපතුල් ගලට මග පෙන්වන පුවරුව



සිරි පතුල් ගල නොහොත් රාම්පාත ගල

සීතාවක ගඟ අසබඩ කණාමැදිරියන් වලට ආසන්නයේ පිහිටි බැරැන්ඩි කෝවිල නිර්මාණය කලේ කවුරුන්දැයි තවමත් නිශ්චිතවම තීරණයකර නොමැති බවක් දක්නට ඇත. මායාදුන්නේ රජු හෝ සීතාවක රාජසිංහ රජු එය ගොඩනැගූ බව පැවසුවත් එහි ඉතිහාසය ඊටත් වඩා ඈතට දිවෙන බව සමහරුන්ගේ අදහසයි. උස් බිමක පිහිටා ඇති මෙය අතීතයේදී වෙනත් දෙවියකු උදෙසා නිර්මාණය කර තිබූ ස්ථානයක් නැවත ප්‍රතිනිර්මාණය කිරීමෙන් බැරැන්ඩි කෝවිල බිහිවුවා වියහැක. ඇතැමුන් මෙයද රාවනාගේ කාලයේ සිට පැවත එන්නක් බව කියති. සීතාවක රාජසිංහ රජු ඇතුළු සේනාව ආරක්ෂාකර දෙන ලෙස සුමන සමන් දෙවියන්ගෙන් ආයාචනය කිරීමට රචනා කල අලගියවන්න මොහොට්ටාලගේ සැවුල් සංදේශයේ 94 වන කවියේ රාවන-රාම යුද්ධය එකල බැරැන්ඩි කෝවිලේ හෝ වෙනත් ලෙනක සිතුවම් කර තිබූ අයුරු මෙසේ වර්ණනා කර ඇත.

දි ය ර ම් රවුළු යුද මහ බාරත යුදද
ම න ර ම් කද කුමර පෙර කළ දිත් යුදද
ඇ ති හි ම් කොටැ ඇඳෑ සිතුවම් රූ නොමඳ
නොවැහිම් සතොස පිරි ළෙන් දැක ගොස් සබඳ



සීතාවක ගඟ



කණාමැදිරියන් වල (ගඟෙහි "වක" ගැසුණු ස්ථානය)

අවිස්සාවේල්ල අග්‍රා පෙදෙස ආදී ස්ථාන වල අද හනුමාන් වෙනුවෙන් භාවනා මධ්‍යස්ථාන පවා ඉදිවෙන පසුබිමක ඓතිහාසික ස්ථාන පිලිබඳ විධිමත් පරීක්ෂණයන් කර මෙම ඉතිහාසකතා සත්‍යදැයි සොයා බලන්නට හැකි නම් ඉතාමත් අගනේය. සාම්ප්‍රදායික රටාවෙන් බැහැරව නව මං ඔස්සේ සාර්ථක පරීක්ෂණ සිදු කිරීමට හැකි වුවහොත් මෙම ස්ථාන නාම සැබෑවටම රාවනා යුගයේ සිදුවීම් වලට සම්බන්ධද නැතහොත් පසු කාලීනව පටබැදුනු ඒවා දැයි නිශ්වය කර ගැනීමට ඇතැම්විට හැකිවනු ඇත.

www.Lakviskam.org

**සීතාවක රාජධානිය**

ක්‍රි.ව. 1521 කෝට්ටෙ රාජධානියේ සිදුවූ විජයබා කොල්ලයෙන් පසු සීතාවක රාජධානිය බිහි විය. විජයබා කොල්ලය යනු කෝට්ටෙ රාජධානියේ රජ කල 7 වන විජයබාහු රජුගේ පළමු විවාහයේ පුතුන් තිදෙනෙකු වූ බුවනෙකබාහු, රයිගම් බණ්ඩාර (පර රාජසිංහ), හා මායාදුන්නේ යන කුමාරවරු විසින් කැරලි ගසා සිය පියා ඝාතනය කරවා රාජ්‍යය පැහැරගෙන කොටස් වලට බෙදා ගැනීමයි. මෙම සිද්ධියට හේතු වුයේ 7 වන විජයබාහු ගේ දෙවන විවාහයේ පුත් කුමරුන්වන "දේවරාජා"හට රාජ්‍ය ලබා දීමට ගෙන තිබූ තීරණයයි. මෙහිදී "බුවනෙකබාහු" හට කෝට්ටෙත් "රයිගම් බණ්ඩාර" හට රයිගමත් රණශූරයකු වූ "මායාදුන්න" හට සීතාවක රාජධානියත් හිමි විය. සීතාවක අගනුවර කර ගනිමින් ක්‍රි.ව.1521 සිට 1581 දක්වා මායාදුන්නේ රජුත්, 1581 සිට 1593 පමණ වනතෙක් මායාදුන්නේගේ පුත්, පළමුවන රාජසිංහ (සීතාවක රාජසිංහ) නොහොත් ටිකිරිබණ්ඩාර කුමරුත් රාජ්‍යය පාලනය කර ඇත. ක්‍රි.ව. 1590 පමණ වනවිට සීතාවක බලය යාපනය සහ කොළඹ හැර දිවයිනේ අනෙක් සෑම ප්‍රදේශයක් පුරාම පැතිරී තිබූ බවට සඳහන් වේ.

පළමුවන රාජසිංහ රජු ලාබාල තරුණ වයසේ සිටම පෘතුගීසීන්ට එරෙහිව සටන් විශාල ප්‍රමාණයක් මෙහෙයවා ඇත. මුල්ලේරියා වෙලේ සිදු කල බිහිසුණු සටන ඉන් එකක් වේ. අංගම්, ඉලංගම් ආදී සටන් ක්‍රම වල අති විශිෂ්ඨ දස්කම් දැක්වූ රණශූරයකු ලෙස රාජසිංහ රජු සඳහන් වේ. පළමුවන රාජසිංහ රජු සිය පියා, මායාදුන්නේ රජුව මැරූ බවට මහාවංශය, මන්දාරම්පුර පුවත, සුළු රාජාවලිය සහ පෘතුගීසි ලේඛන වල සමහරක සඳහන් වෙතත් එය සත්‍යයක් නොවන බවට රාජාවලිය, ක්වේරෝස් ගේ ලේඛන ඇතුළු පෘතුගීසි ලේඛන කිහිපයක, මානියම්ගම රාජසිංහ රාජ්ජ කාලය පුස්කොල පොත ආදියෙහි සඳහන් වේ. බලන ප්‍රදේශයේදී කොනප්පු බණ්ඩාර සමග සටන්කර ආපසු පැමිණෙන අතරවාරයේ සිය රාජධානියේ පෙතංගොඩ උයනේ දී උණ කටුවක් ඇනී බරපතල ලෙස අසනීප වී ඇත.

අසනීප වූ රජුව අගුලක නංවාගෙන කැළණි ගඟෙන් පැමිණ හිගුරුමෝදරින් සීතාවක ගඟේ උඩුගං බලා එද්දී රජු අවසන් හුස්ම හෙලූ බවට සඳහන් වේ. "කිකිළිබිත්තර වැල්ල" ප්‍රදේශයේදී රජු භූමදානය කිරීමට තීරණය කර ගොඩබිම දෙසට ඇලක් කපා උමගක් සේ සකස් කර දේහය අතින්වත් නොඅල්ලා අගුල සමගම ගෙන ගොස් උමගේ රිංගවා පස් දමා වැසූ බවට කිය වේ. අවිස්සාවේල්ල සිට අමිතිරිගල දෙසට දිවෙන මාර්ගයේ වැලිවිටිය අසල මෙම ස්ථානය අද පුරා විද්‍යා දෙපාර්තුමේන්තුව විසින් රාජසිංහ රජුගේ සොහොන ලෙස නම් කර ඇතත්, නිසි කැණීමක් හෝ මෙතෙක් කර නැත. එම නිසා කුඩා කළු ගල් කණු ස්මාරක කිහිපයක් සහිත මෙය නිශ්චිතවම රාජසිංහ රජුගේ සොහොන දැයි සැක පවතී. මානියම්ගම පුස්කොල පොත, අලකේශ්වර යුද්ධය, වැනි ලේඛන වල කියවෙන්නේ රජුව සීතාවකදී නිසි ගෞරවය දක්වා භූමදාන කල බවකි. මෙම සොහොන, රාජසිංහ රජු විසින් උපක්‍රමශීලීව තම රාජධානියට ගෙන්වා බොරු වලක වට්ටවා මරණයට පත් කරවූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජුගේ පියා වන යුවරජු වීරසුන්දර බණ්ඩාරගේ බවට ජනප්‍රවාදයක් පවතී.


රාජසිංහ සොහොන


බැරැන්ඩි කෝවිල

www.Lakviskam.org

අවිස්සාවේල්ල අමිතිරිගල මාර්ගයේ ගුරු ගල් පාලම අසබඩ පිහිටා ඇති මැදගොඩ පත්තිනි දේවාලයද සීතාවක රාජසිංහ රජතුමා විසින් සිය බිසවවූ මල්වති සිහිවීම පිණිස ඉදි කලේයැයි කියවේ. එකල හැට හැවිරිදි වියද පසුවූ රජු පෙතංගොඩ සිය රාජකීය උයනට ගොස් එන අතර ගෝනගල ගමේදී දිය නාමින් සිටි දහසය හැවිරිදි අතිශය රූබර යෞවනියක දැක සිත් පහළ වී ඇයව අග බිසව කර ගත්තේලු. ඇය වූකලී එකල සුප්‍රසිද්ධ නැකත්කරුවකු වූ දොඩම්පේ ගණිතයාගේ දියණියයි. රාජසිංහ රජුගේ මුනුබුරෙකුවූ "රාජසූරිය" නමැති කුමාරයාද මෙම තරුණිය සමග පෙමින් බැදී සිටියේය. මෙම සිදු වීමෙන් දොඩම්පේ ගණිතයා සහ රාජසූරිය කුමරා රජු සමග දැඩි වෛරයකින් පසු විය. මල්වති අග බිසව සමග දැඩි ආදරයෙන් සිටි රජුට හදිසියේම ඇය අසනීප වී මියයාමෙන් එය දරාගැනීමට නොහැකි විය. ඇයට ඇති සෙනෙහස නිසාම ඇය සිහිවීම පිණිස ක්‍රි.ව. 1592 දී පමණ මැදගොඩ දේවාලය කරවා එය පත්තිනි දේවියට පූජා කලබවට කියවේ. මෙම දේවාලය හා බැදුණු කලින් සඳහන් කල සිදුවීමට පෙර සිදුවූ කතා පුවතක්ද ඇත. රජු කැළණි ගඟ ඔස්සේ අගුලකින් පෙතංගොඩ උයනට යද්දී මෙම ස්ථානය ආසන්නයේදී අගුල නැවතිනි. මාලමීගොල්ලා නැමැත්තා දියෙහි කිමිදී අගුල නතර වීමට හේතුව සෙව්වත් කිසිවක් හමු නොවිණි. අවට පිරික්සද්දී දෙවියන්ට පහන් දල්වා තිබෙනු දැක රජුද එහි පහනක් දල්වා අගුල රැගෙන යාමට ඉඩ සලසන්නේ නම් එහි දේවාලයක් කරවා පත්තිනි දේවියට පූජා කරන බවට බාර විය. එවිට අගුල නිරුපද්‍රිතව එතනින් ගෙනයාමට ලැබුනේලු.

රාජසිංහ රජුගේ මියයාම සීතාවක ඓතිහාසික ග්‍රන්ථයක සඳහන් වන්නේ මෙසේය. උඩරට සටනකට ගොස් පරාජය ලබා පසුබැස එනවිට හත්මත්ත ගමේදී රාජසූරිය කුමාරයා මුගුරකින් රජුගේ පාදයකට පහර දුන් බවත් එයින් තුවාල ලැබූ රජුගේ පාදයට දොඩම්පේ ගණිතයා විෂ සහිත බෙහෙත් බැඳ යටියන්තොටට පලාගොස් විශාල කොස් ගසක බෙනයක සැඟවී සිටි බවත් ය. පසුව තුවාලය අසාධ්‍යවී රජු මිය ගියේලු.

මායාදුන්නේ හා පළමුවන රාජසිංහ යන රජවරුන් හට සිය රාජ්‍ය පාලන කාලය පුරාම තම රාජ්‍යයට එල්ලවන සතුරු බලවේග සමග නිති සටන් කිරීමට සිදු විය. මේ නිසා ඔවුන් හට වෙනත් කාර්යයන් වලට අත ගැසීමට නොහැකි වූ බවට විශ්වාස කෙරේ. මේ හේතුව සහ කෙටි ආයු කාලයක් සහිත වූ සීතාවක රාජධානියේ නටබුන් පවාදක්නට ලැබෙන්නේ සාපේක්ෂව අඩු වශයෙනි. කෙසේ වෙතත් කුරුවිට දෙල්ගමුව විහාරයේ කුරහන් ගල තුල වැඩවිසූ දළදා වහන්සේ වෙනුවෙන් රත්නපුර මහා සමන් දේවාලයේ 11 වසරක් පුරා පෙරහැර පැවත්වීම රාජසිංහ රජු විසින් කරන ලද බවට සඳහන් වේ. බොල්තුඹේ හා දැරණියගල සමන් දේවාලද ඔහු විසින් කරවන ලද බවට කියවේ. අවිස්සාවේල්ල සිට පනාවල දෙසට දිවෙන මාර්ගයේ දකුණු පසින් බණ්ඩාරවත්ත නමැති ස්ථානයේ පිහිටි සීතාවක රජ මාලිගයේ යැයි විශ්වාස කරන කොටසක් කැනීම් වලින් මෑතකදී මතු කරගෙන ඇත. මෙම ස්ථානයේම ඕලන්ද බලකොටුවත් දක්නට ලැබේ.



මාලිගාවේ නටබුන්



පස් වලින් වැසූ මාලිගාව

www.LakViskam.org

මාලිගය යැයි සැක කෙරෙන ගොඩනැගිල්ල විනාශ කර සතුරන් විසින් පස් දමා වසා තිබෙන අයුරු අද පවා දැකිය හැක. එම පනාවල මාර්ගයේම පනාවල දෙසට ගියවිට වම් පසින් අනුරාධපුර වළගම්බා රජු සමයේ කරවූයේ යයි සැලකෙන (ක්‍රි.පූ. 103-76) ඓතිහාසික මානියම්ගම රජමහා විහාරයට පිවිසෙන මාර්ගය හමු වේ. යකහටුවගල කන්ද පාමුල පිහිටි එම විහාරය තුල කටාරම් සහිත විශාල ලෙනක් තුල විහාර ගෙය පිහිටුවා ඇත. එම විහාර ගෙය තුල පෞරාණික 18 රියන් සැතපෙන පිළිම වහන්සේ නමක්ද සමාධි මුද්‍රාවෙන් වැඩ සිටින හිඳි පිළිමයක්ද, අභය මුද්‍රාවෙන් වැඩ හිඳින පිළිම වහන්සේ දෙනමක් හා විෂ්ණු දේව ප්‍රතිමාවක්ද ඇත. මහනුවර යුගයට අයත් විනාශ වී නොපෙනී යන බිතු සිතුවම් රැසක්ද එහි දක්නට ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ඓතිහාසික රාජකීය වී කරල් පෙරහැර ක්‍රි.ව. 1766 දී ආරම්භ කරන ලදී. දුරුතු පුන් පොහෝ දින පවත්වන මෙය ශ්‍රීලංකාවේ අදටත් පැවැත්වෙන එකම කරල් පෙරහැරද වේ.



මානියම්ගම ලෙන් විහාරය



විනාශ වන මානියම්ගම විහාර චිත්‍ර

රාජසිංහ රජු තම පියා මැරූ බවට ලිඛිත සාක්ෂි ඇතත් එය එසේ නොවන බවට දැක්වෙන ලිඛිත සාක්ෂිද ඇත. එම නිසා එම මතය ගැන ප්‍රබල එකඟතාවයක් නොමැත. තම පියා මැරූ නිසා එම පාපයෙන් මිදීමට අරිට්ඨකීවෙන්ඩු නමැති හින්දු ආඩියාගේ උපදෙස් මත හින්දු ආගමට හැරුණු බව කියවේ. අරිට්ඨකීවෙන්ඩුගේ උසිගැන්වීමෙන් භික්ෂූන් වහන්සේලා 120ක් පමණ සීතාවක ගඟේ කණාමැදිරියන්වල නම් ගැඹුරු වක්කමේ ගිල්වා මැරූ බවද කියවේ. සීතාවක රාජධානියට අයත් පුරාවස්තු අතර තල්දූව පිහිටි බැරැන්ඩි කෝවිල ඉතා වැදගත් ස්ථානයක් ගනී. මෙය ඉදි කරන ලද්දේ කවුරුන් විසින්දැයි පැහැදිලි නොමැතිමුත් මායාදුන්නේ රජු විසින් එය ඉදි කරන්නට ඇතැයි සැලකේ. රාජසිංහ රජුද එය ගොඩනැගීමට හවුල් වන්නට ඇත. කෙසේ නමුත් මෙම කෝවිලේ වැඩ අවසන් නොවූ බවට තවත් මතයක් ඇත. සීතාවක රජවරුන් හින්දු ආගමික බලපෑමට හසු වූ බවට බැරැන්ඩි කෝවිල වැනි නටබුන් වලින් මනාව පැහැදිලි වේ.

**අවිස්සාවේල්ල නම බිහිවුයේ කෙසේද?**

කෙටි කාලයක් පැවති සීතාවක රාජධානියට ආසන්නයෙන් පිහිටා ඇති අවිස්සාවේල්ලට වර්තමානයේ භාවිතා කරන එම නම ලැබුණු සැටි කියවෙන සිදු වීම් කිහිපයක් පහත පරිදි වේ. කන්ද උඩරට දෙවන රාජසිංහ රජු සමයේ පරංගීන්ට රාජ්‍ය තොරතුරු සැපයූ කිහිප දෙනෙකු අල්ලා මෙම ප්‍රදේශයේදී වේල්ලකට තබා මැටි ගසා මැරූ බවට කියවේ. මෙම "අවිස්වාස අය මැටි ගැසූ වේල්ල" පසුව අවිස්සාවේල්ල වූ බවට එක් මතයකි. එසේම තවත් ජන කතාවක කියවෙන්නේ මේ ආසන්නයේ වූ අබලන් වූ වේල්ලකින් නිරතුරු ජලය නිකුත් වෙමින් පැවති බවත් මෙම වේල්ල බිදී යාමට අසන්න නිසා "අවිස්වාස වේල්ල" යන නම භාවිතා වී පසුව අවිස්සාවේල්ල වූ බවත්ය. පෘතුගීසී බසට අනුව දූෂ්‍ය්‍යා යන්න  හැදින්වීමට "අවිසෝ" වචනයත් ප්‍රදේශය හැදින්වීමට "වෙලා" යන වචනයත් භාවිතා කර ඇත. එකල පෘතුගීසීන් පළමු රාජසිංහ රජු දූෂ්‍ය්‍යෙක් ලෙස සැලකූ නිසා මෙම ප්‍රදේශය පසුව අවිස්සාවේල්ල වූ බවටද මතයක් පවතී.

අවිස්සාවේල්ල අද සීග්‍ර දියුනුවක් ලබා ඇති අතර එහි සිට රටේ සතර අතට ප්‍රවාහන පහසුකම් පවා ඇත. එසේම එහි වැළලී ගිය පුරාවස්තු ඉතා විශාල ප්‍රමාණක් ඇති අතර බලධාරීන්ගේ අවධානය කඩිනමින් යොමු නොවීම නිසා ඒවා සදහටම වැළලී යමින් ඇත. මෙම අගනා වස්තු විනාශ නොවී රැක ගැනීමට බලධරයින් අප්‍රමාදව කටයුතු කරත්වා!

අප සංචාරයේ තවත් ජයාරූප එකතුවක් මෙතනින් නරඹන්න

https://picasaweb.google.com/102500057347588371605/SeethawakaPura?noredirect=1

මෙම වාර්තාවේ අයිතිය "ලක් විස්කම්" වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org (31-දෙසැම්බර්-2014)

විමසීම් සහ අදහස්: lakviskam@gmail.com

www.LakViskam.org